ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

விளையாட்டுத்துறை மற்றும் இளைஞர் விவகார அமைச்சு

Ministry of Sports and Youth Affairs

# ජාතික ක්‍රීඩා අරමුදල

# தேசிய விளையாட்டு நிதி

# National Sports Fund







# 2022

## වාර්ෂික වාර්තාව

## வருடாந்த அறிக்கை

## Annual Report

# පටුන



| අනු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 01 | හැඳින්වීම | 03 |
| 02 | දැක්ම,මෙහෙවර | 03 |
| 03 | ක්‍රීඩා අරමුදලේ කාර්යභාරය | 04 |
| 04 | නීතිමය පසුබිම | 04 |
| 05 | ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම | 05 |
| 06 | ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 05 |
| 07 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම | 05 |
| 08 | වෙනත් වියදම් | 06 |
| 09 | කෘතඥතාව | 07 |
| 10 | ජාතික ක්‍රීඩා අරමුදලේ විගණිත මූල්‍ය ප්‍රකාශ | 08 - 27 |
| 11 | විගණකාධිපති වාර්තාව | 28 - 37 |

# ජාතික ක්‍රීඩා අරමුදල

# වාර්ෂික වාර්තාව - 2022

## හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය. වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

## දැක්ම

ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම

## මෙහෙවර

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, ඒවා දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ආධාර සහ අනුබල දීම ජාතික ක්‍රීඩා අරමුදලේ මෙහෙවරයි.

## ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්ය භාරය

ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ක්‍රීඩා අරමුදල මඟින් ශ්‍රී ලාංකේය ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා ක්‍රීඩාවට සම්බන්ධිත මානව සම්පත් වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේ භෞතික හා වෙනත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අරමුදල් ලබාදීම සිදු කරනු ලබයි.

වර්තමානයේ ක්‍රීඩා අරමුදල මඟින් මතු සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් අවස්ථානෝචිත පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

එනම් ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ වෙනුවෙන් ක්‍රීඩකයින් හා පුහුණුකරුවන් වෙත අනුමත කර ඇති නිර්ණායකයන් යටතේ ගෙවීම් කිරීම, හඳුනාගත් නිර්ණායකයන් යටතේ මාසිකව ක්‍රීඩකයන් සඳහා සිදු කරන පෝෂණ දීමනා ගෙවීම්, ක්‍රීඩාවේ අභිවෘද්ධිය වෙනුවෙන් නිර්දේශිත විශේෂිත ඉල්ලීම් සඳහා දෙනු ලබන දීමනා, ජාතික මහා ක්‍රීඩා උළෙල සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කරනු ලබන ගෙවීම්, විශේෂිත වූ ක්‍රීඩා උත්සව සඳහා සිදු කරන තිළිණ ප්‍රදානයන්, විශේෂිත ප්‍රදානයන් (එනම් විශ්වවිද්‍යාල හා වෙනත් ආයතන සඳහා සිදු කරනු ලබන ක්‍රීඩා උත්සව වෙනුවෙන් ගෙවීම්, ක්‍රීඩකයන් විශ්‍රාම යාමේදී/ක්‍රීඩාවෙන් සමුගැනීමේ දී සිදු කරන ගෙවීම්, විශේෂිත ක්‍රීඩා උපකරණ ඉල්ලීම් සඳහා අනුග්‍රහය දැක්වීම, දේශීය විදේශීය තරඟ වෙනුවෙන් විවිධ කණ්ඩායම් සඳහා කරන දීමනා ගෙවීම්, සානුකම්පිත හේතූන් මත ක්‍රීඩාවට සම්බන්ධ වූ පුද්ගලයන්ට සිදු කරන ගෙවීම් හා ක්‍රීඩාවේ සංවර්ධනය අපේක්ෂිතව සිදු කරනු ලබන වෙනත් ගෙවීම් වේ).

## නීතිමය පසුබිම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතින් ජාතික ක්‍රීඩා අරමුදල ස්ථාපිත කරනු ලැබීය. පනතට අනුව අරමුදලේ කාර්යයන් සඳහා රජයෙන් ලැබිය හැකි මුදල් විදේශ රටකින් ලැබෙන ආධාර මුදල්, යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන් අනුග්‍රහය දැක්වීම පිණිස යම් ආයතනයකින් ලැබෙන මුදල්, යම් තැනැත්තෙකු විසින් පරිත්‍යාග වශයෙන් ලැබෙන මුදල්, වෙනයම් මාර්ගයකින් ලැබෙන මුදල් අරමුදලට බැරවිය යුතුය. අමාත්‍යවරයා විසින් නිශ්චය කරණු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, දියුණු කිරීම හා සංවර්ධනය සඳහා ද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන්ද, ආයෝජනය කිරීම සඳහා ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්ය සඳහා ද අරමුදලෙන් මුදල් ගෙවිය හැකිය.

## ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මුදල් ආධාර ලබා දීම

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ චිත්ත ධෛර්‍යය වර්ධනය කිරීමට හා ශාරීරික යෝග්‍යතාව ප්‍රසස්ථ මට්ටමින් පවත්වාගෙන යාම අරමුණු කර ගෙන මුදල් ආධාර ලබා දෙන ලදී. තවද, ශ්‍රී ලංකා නාමය ජාත්‍යන්තර තලයට රැගෙන යාම හා ක්‍රීඩා ක්ෂේත්‍රය වෙනුවෙන් කරන ලද අමිල මෙහෙවර උදෙසා තරඟකාරී ක්‍රීඩාවෙන් සමුගන්නා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම් සිදුකර ඇත.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ක්‍රීඩකයින් සඳහා පෝෂණ දීමනා | 2,601,004.00 |
| 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 700,000.00 |
| | **එකතුව** | **3,301,004.00** |

## ක්‍රීඩා තරඟ වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම

2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුල පවත්වන ලද ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ සඳහා වූ ජාතික ක්‍රීඩා අරමුදලේ දායකත්වය පහත දක්වා ඇත. විශේෂයෙන් 2022 වර්ෂයේ පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රිඩා උලෙළ හා ආසියානු ක්‍රීඩා උලෙළ සඳහා සහභාගී වූ ක්‍රීඩා සංගම් හා සම්මේලන 09 ට අයත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒ සඳහා සහභාගී වීමට වැයවූ වියදම් ලබා දෙන ලදී.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | ජාත්‍යන්තර තරඟ | 79,053,719.00 |
| | **එකතුව** | **79,053,719.00** |

## පුහුණු කරුවන් වෙනුවෙන් මුදල් ආධාර ලබා දීම

දැනට ක්‍රීඩාවේ නියුක්තව සිටින ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා හා නිපුණතා වර්ධනය කර ජාත්‍යන්තර තලයට ඉහල නැංවීම උදෙසා ඉටුකරන සේවය වෙනුවෙන් පුහුණුකරුවන් සඳහා මුදල් ආධාර ලබා දෙන ලදී. තවද, 22 වන පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රිඩා උලෙළ සඳහා සහභාගී වී ජයග්‍රහනය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා හා එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් එම ජයග්‍රහන කරා රැගෙන යාම වෙනුවෙන් ඔවුන්ගේ පුහුණු කරුවන් ඇගයීමකට ලක්කිරීම වෙනුවෙන් මූල්‍යමය ත්‍යාග ලබා දීම.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1. | තරඟ ජයග්‍රාහක ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණු කරුවන් වෙනුවෙන් දීමනා | 83,151,500.00 |

| | | |
|---|---|---|
| | එකතුව | **83,151,500.00** |

**වෙනත් වියදම්**

2022 වර්ෂය තුල ජාතික ක්‍රීඩා අරමුදලේ පරිපාලනමය කටයුතු උදෙසා වැයවන වියදම් දැරීම හා අභියායවනා උපදේශන කමිටුව මගින් කරන ලද සේවය උදෙසා ගෙවීම් කිරීමත්, ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයින්ගේ මාසික දීමනාව ලබාදීමත්, ජාතික ක්‍රීඩා සභාවේ කළමණාකරන සහකාර තනතුරහි සේවය කරණ නිලධාරීන් හට ඔවුන්ගේ මාසික වැටුප් ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ අනුමැතිය මත දරන ලද වියදම් විස්තර පහත දැක්වේ.

| අනුක්‍රමික අංකය | කාරණය | ගෙවූ මුදල (රු.) |
|---|---|---|
| 1 | පරිපාලන වියදම්(ජාතික ක්‍රීඩා අරමුදලේ ගිණුම් කටයුතු වෙනුවෙන්) | 183,000.00 |
| 2 | අභියායවනා උපදේශන කමිටුව | 209,500.00 |
| 3 | ජාතික ක්‍රීඩා සභාව | 415,667.00 |
| 4 | වෙනත් දීමනා | 547,490.00 |
| 5 | විගණන ගාස්තු | 361,818.00 |
| | එකතුව | **1,717,475.00** |

# කෘතඥතාව

ජාතික ක්‍රීඩා අරමුදලේ පාලනය හා පරිපාලනය සඳහා විධාන ලබා දෙමින් එහි පරිපාලනයට මා වෙත දැක්වූ සහයෝගයට ගරු ක්‍රීඩා අමාත්‍යතුමාට කෘතඥතාව පලකරමි. එමෙන්ම ජාතික ක්‍රීඩා අරමුදලේ කටයුතු කලමණාකරණයට හා ගිණුම් තැබීම වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශ නිලධාරීන්ගේ කැපවීම හා අරමුදලේ කටයුතු වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.මහේසන්
ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2022 | | සටහන | තත්‍ය 2022 | 2021 නැවත ප්‍රකාශිත ආදායම |
|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | - |
| 54,050,967 | 1- රජයේ ප්‍රදාන | 3.1 | 119,063,017 | 190,020,300 |
| - | 2 - ආයෝජන | 3.2 | 1,291,057 | 1,154,400 |
| 279,618,090 | 3 - වෙනත් ආදායම් | 3.3 | 279,618,089 | 21,474,465 |
| **333,669,057** | මුළු ආදායම් ලැබීම් | | 399,972,163 | 212,649,165 |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - |
| | 4 - තැන්පතු | 3.4 | 330,000 | - |
| - | වෙනත් ලැබීම් | | | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් | | **330,000** | - |
| **333,669,057** | මුළු ආදායම් ලැබීම් සහ | | **400,302,163** | **212,649,165** |
| | අඩුකළා : වියදම් | | | |
| - | පුනරාවර්තන වියදම් | | | |
| 75,000,000 | 5.1. - ආයෝජන | | | |
| 201,148,519 | 6.1. - ක්‍රීඩා තරඟ | 4.1 | 201,148,519 | 108,145,941 |
| 3,895,904 | 6.2. - සුභසාධන දීමනා | 4.2 | 3,895,904 | 9,787,005 |
| - | 6.3. - සංවර්ධන ව්‍යාපෘති | | | |
| 300,000 | 6.4. - හැකියා වර්ධනය | 4.3 | 300,000 | 71,055,500 |
| 1,804,978 | 6.5 - පරිපාලන වියදම් | 4.4 | 1,767,475 | 11,194,117 |
| **282,149,401** | මුළු පුනරාවර්තන වියදම් | | **207,111,898** | **200,182,563** |
| | මුළු වියදම් | | 207,111,898 | 200,182,563 |
| 51,519,656 | 2022 දෙසැම්බර් 31 දිනට අතිරික්තය/ ඌණතාවය | | 193,190,265 | 12,466,602 |

.......................................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : කේ. මහේසන්
තනතුර : ලේකම්
දිනය : 2023/06/20
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
අංක.09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

.......................................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2023/06/20
එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2022 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | 2022 | 2021 නැවත ප්‍රකාශිත |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **මූල්‍ය වත්කම්** | | | |
| ආයෝජන ගිණුම | 5 | 91,938,363 | 16,089,059 |
| මුදල් ශේෂය | 6 | 67,307,526 | 15,787,870 |
| විවිධ ණය ගැතියෝ | 7 | 95,724,700 | 30,270,897 |
| මුළු වත්කම් | | 254,970,589 | 62,147,826 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **ජංගම නොවන බැරකම්** | | | |
| සමුච්චිත අරමුදල | 8 | 254,798,589 | 61,608,323 |
| **ජංගම වගකීම්** | | | |
| විවිධ තැන්පත් | 9 | - | 330,000 |
| උපචිත වියදම් | 10 | 172,000 | 209,503 |
| ජංගම වගකීම් | | 172,000 | 539,503 |
| මුළු වගකීම් | | 254,970,589 | 62,147,826 |

පිටු අංක...01.......සිට ...03...... දක්වා ආකෘතිපත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු පිටු අංක ......04.... සිට .....20.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | |
|---|---|
| ....................................... | ....................................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : කේ. මහේසන් | නම : |
| තනතුර : [illegible] | දිනය : 2023/02/24 |
| දිනය : ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | එස්.එන්. හපුආරච්චි |
| අංක.09, පිලිප් ගුණවර්ධන මාවත, | ප්‍රධාන ගණකාධිකාරි |
| කොළඹ 07. | තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය |

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2022<br>රු. | සටහන<br>2021 නැවත ප්‍රකාශිත<br>රු. |
|---|---|---|
| වර්ෂයේ අතිරික්තය | 193,190,265 | 12,466,602 |
| | 193,190,265 | 12,466,602 |
| ආයෝජන පොලී අධි ගණනය කිරීම් | | |
| විගණන ගාස්තු අධි වෙන්කිරීම් | | |
| මුදල් නොවන වෙනස්වීම | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| ණය ගැතියෝ අඩුවීම/වැඩිවීම | 65,453,803 | 12,301,010 |
| විවිධ තැන්පතු වැඩිවීම/වැඩිවීම | (330,000) | (10,000) |
| විවිධ ණය හිමියෝ අඩුවීම/වැඩිවීම | 37,503 | (62,503) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | 65,161,306 | 12,228,507 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර තැන්පත් වැඩිවීම | (75,849,304) | (1,443,594) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | (75,849,304) | (1,443,594) |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | 51,519,656 | (1,225,499) |
| කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 15,787,870 | 17,013,369 |
| කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් සමාන දෑ | 67,307,526 | 15,787,870 |

.......................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : **කේ. මහේසන්**
තනතුර : **ලේකම්**
දිනය : **ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය**
**අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,**
**කොළඹ 07.**
2023/ /

.......................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2023/02/24
එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

### 1 හැඳින්වීම

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරණ ක්‍රීඩා පනතේ අංක 22 සිට 27 දක්වා ඇති විධිවිධාන අනුව ස්ථාපිත කරනු ලැබූ ජාතික ක්‍රීඩා අරමුදල 2007 වර්ෂයේ සිට ක්‍රීඩා අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.වාර්ෂිකව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම හා ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කර ගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යන ලදී.

### 2 ගිණුම් සකස් කිරීමේ පදනම

**2.1** අනුකූලතා ප්‍රකාශය

ක්‍රීඩා අරමුදලේ මූලය ප්‍රකාශන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය,ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත

**2.2** මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**2.3** වාර්තාකරණ කාල පරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයට අදාල වාර්තා කරන කාලපරිච්ඡේදය වේ.

**2.4** මූල්‍ය ප්‍රකාශනවල පෙර වර්ෂයේ අගයන් සංසන්දනාත්මකව නැවත ගැලපීම

2021 වර්ෂයට අදාලව හඳුනාගන්නා ලද වෙනස්කම් 2021 වර්ෂයේ ගිණුම්වලට සංසන්දනාත්මකව ගැලපීම සිදුකර නැවත ප්‍රකාශිත කර ඇත.

**2.5** උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

## 3 ආදායම් ලැබීම් සඳහා සටහන්

### සටහන් 03.1 - රජයේ ප්‍රදාන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2022 | 2021 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 1 | | රජයේ ප්‍රදාන | | |
| 1 | 1 | ප්‍රදාන | 29,050,967 | 177,125,000 |
| 1 | 2 | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 90,012,050 | 12,895,300 |
| | | | 119,063,017 | 190,020,300 |

### සටහන් 03.2 - ආයෝජන

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2022 | 2021 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 2 | | ආයෝජන | | |
| 2 | 1 | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | |
| 2 | 2 | ස්ථාවර තැන්පතු පොළී | 1,291,057 | 1,154,400 |
| | | | 1,291,057 | 1,154,400 |

### සටහන් 03.3 - වෙනත් ආදායම්

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2022 | 2021 නැවත ප්‍රකාශිත ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 3 | | වෙනත් ආදායම් | | |
| 3 | 1 | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | අනුග්‍රාහක ලැබීම් | 279,561,638 | 20,875,000 |
| 3 | 3 | වෙනත් ආදායම් හා ගැලපීම් | 56,452 | 599,465 |
| | | | 279,618,089 | 21,474,465 |

### සටහන් 03.4 - තැන්පතු

| ආදායම් සංකේතය | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2022 | 2021 ආදායම |
|---|---|---|---|---|
| | | | රු.ශත | රු.ශත |
| 4 | | තැන්පතු | | |
| 4 | 1 | තැන්පතු ලැබීම් | 330,000 | |
| 4 | 2 | වෙනත් | | |
| | | | 330,000 | - |

## 4 වියදම් සඳහා සටහන්

### සටහන් 4.1 - ක්‍රීඩා තරඟ

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 වියදම රු.ශත | 2021 වියදම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 1 | | | ක්‍රීඩා තරඟ | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 38,943,300 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 79,053,719 | 108,145,941 |
| 6 | 1 | 3 | | පුහුණුකරු | 83,151,500 | - |
| | | | | | 201,148,519 | 108,145,941 |

### සටහන් 4.2 - සුභසාධන් දීමනා

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 වියදම රු.ශත | 2021 වියදම රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 2 | | | සුභසාධක දීමනා | | |
| 6 | 2 | 1 | | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා | | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 2,601,004 | 8,215,107 |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 700,000 | 631,898 |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 594,900 | |
| | | | | ක්‍රීඩකයින් සඳහා වෛද්‍යාධාර | | - |
| | | | | ක්‍රීඩා භාණ්ඩ හා අනෙකුත් සැපයුම් | | - |
| | | | | ක්‍රීඩකයින් සඳහා උපහාර | | - |
| 6 | 2 | 2 | | පුහුණුකරුවන් සඳහා | | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | - | 940,000 |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | - | |
| | | | | | 3,895,904 | 9,787,005 |

### සටහන් 4.3 - හැකියා වර්ධනය

| වියදම් සංකේතය | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 වියදම රු.ශත | 2021 වියදම රු.ශත |
|---|---|---|---|---|---|
| 6 | 4 | | කාර්යසාධනය | | |
| 6 | 4 | 1 | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 150,000 | 55,655,500 |
| 6 | 4 | 2 | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 150,000 | 15,400,000 |
| 6 | 4 | 3 | නිලධාරින්ගේ හැකියා වර්ධනය | | |
| | | | | 300,000 | 71,055,500 |

## සටහන් 4.4 - පරිපාලන වියදම්

| වියදම් සංකේතය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 වියදම<br>රු.ශත | 2021 වියදම<br>රු.ශත |
|---|---|---|---|---|---|---|
| 6 | 5 | | | පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | | පොදු පරිපාලන වියදම් | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 183,000 | 363,500 |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 361,818 | 150,000 |
| 6 | 5 | 1 | 3 | තැපැත්පතු ගෙවීම් | | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 547,490 | 10,118,170 |
| 6 | 5 | 2 | | ක්‍රීඩා පරිපාලන වියදම් | | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 209,500 | 212,258 |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 415,667 | 350,190 |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 50,000 | |
| | | | | | **1,767,475** | **11,194,118** |

## 5 ආයෝජන

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 16,089,059 | 14,645,465 |
| වර්ෂයේ එකතුකිරීම් | 75,000,000 | 32,000,000 |
| වර්ෂයේ ඉවත්කිරීම් | - | 32,000,000 |
| පොලිය | 849,304 | 1,443,594 |
| අවසාන ශේෂය | 91,938,363 | 16,089,059 |

## 6 මූල්‍ය ප්‍රවාහ සඳහා සටහන්

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 15,787,870 | 17,013,369 |
| වර්ෂයේ ලැබීම් | 333,669,056 | 231,208,111 |
| වර්ෂයේ ගෙවීම් | 282,149,401 | 232,433,610 |
| අවසාන ශේෂය | 67,307,526 | 15,787,870 |

## 7 විවිධ ණයගැතියෝ

### සටහන් 7.1 - ජාතික ලොතරැයි මණ්ඩලය

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 29,421,593 | 16,526,293 |
| වර්ෂයේ ආදායම | 90,012,050 | 12,895,300 |
| ගැලපීම් | | - |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් | 25,000,000 | |
| අවසාන ශේෂය | 94,433,643 | 29,421,593 |

### සටහන් 7.2 - ස්ථාවර තැන්පතු පොලී

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 849,304 | 1,443,594 |
| වර්ෂයේ පොලිය | 1,341,810 | 1,109,881 |
| වර්ෂයේ ඉවත්කිරීම් | - | |
| අවසාන ශේෂය | 1,291,057 | 849,304 |

## 8 ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය

| විස්තරය | 2022<br>රු.ශත | 2021 නැවත ප්‍රකාශිත<br>රු.ශත |
|---|---|---|
| 2022.01.01 දිනට සමුච්චිත අරමුදල | 61,608,323 | 49,141,721 |
| 2022 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | 193,190,265 | 12,466,602 |
| වෙනත් ගැලපීම් | | - |
| 2022.12.31 දිනට සමුච්චිත අරමුදල | 254,798,589 | 61,608,323 |

## 9 විවිධ තැන්පත්

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 330,000 | 340,000 |
| වර්ෂයේ ලැබීම් | - | - |
| ආදායමට මාරු කිරීම් | 330,000 | 10,000 |
| අවසාන ශේෂය | - | 330,000 |

## 10. උපචිත වියදම

| විස්තරය | 2022<br>රු.ශත | 2021<br>රු.ශත |
|---|---|---|
| ආරම්භක ශේෂය | 209,503 | 147,000 |
| වර්ෂයේ එකතුකිරීම් | 172,000 | 209,503 |
| වර්ෂයේ ගෙවීම් | 209,503 | 147,000 |
| අවසාන ශේෂය | 172,000 | 209,503 |

.........................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2023/02/28

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

## ජාතික ක්‍රීඩා අරමුදල
## 2022.12.31 දිනෙන් අවසන් දිනට ශේෂ පිරික්සුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තර | ලෙජර් පිටු අංකය | හර | බැර |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | රු. | රු. |
| | | | | සමුච්චිත අරමුදල - 2022.01.01 දිනට | 01 | | 61,608,323 |
| | | | | ආයෝජන ගිණුම | 02 | 91,938,363 | |
| 1 | 1 | | | ප්‍රදාන | 03 | | 29,050,967 |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 04 | | 90,012,050 |
| 1 | 2 | | | ජාතික ලොතැරැයි මණ්ඩලය ආදායම ලැබිය යුතු | 04 | 94,433,643 | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 02 | | 1,291,057 |
| 2 | 2 | | | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී | 02 | 1,291,057 | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 05 | | 279,561,638 |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 06 | | 56,452 |
| 4 | 1 | | | තැන්පතු ගිණුම | 07 | | 330,000 |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 08 | 38,943,300 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 09 | 79,053,719 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙ | 10 | 83,151,500 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 11 | 2,601,004 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 12 | 700,000 | |
| 6 | 2 | 1 | 3 | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 13 | 594,900 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | 14 | - | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | 15 | - | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 17 | 150,000 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 18 | 150,000 | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | 19 | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 20 | 183,000 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 21 | 361,818 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු වෙන්කිරීම | 21 | | 172,000 |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 22 | 547,490 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් - ගෙවිය යුතු | 22 | | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 23 | 209,500 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 24 | 415,667 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 25 | 50,000 | |
| | | | | මුදල් ශේෂය | | 67,307,526 | |
| | | | | | | | |
| | | | | | | 462,082,486 | 462,082,486 |

..............................................
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය : 2023/02/22

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

ඇමුණුම - 02

# ජාතික ක්‍රීඩා අරමුදල
## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | ලැබීම් 2022 | ලැබීම් 2022 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. |
| | | | | ජනවාරි 01 දිනට ශේෂය | | 15,787,870 |
| 1 | 1 | | | ප්‍රදාන | 29,050,967 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 25,000,000 | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | - | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | - | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 279,561,638 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 56,452 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | - | |
| 4 | 2 | | | වෙනත් | | |
| | | | | | | 333,669,056 |
| | | | | ලැබීම් එකතුව | | 349,456,927 |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 ගෙවීම් | 2022 ගෙවීම් |
|---|---|---|---|---|---|---|
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | 75,000,000 | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 38,943,300 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 79,053,719 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 83,151,500 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 2,601,004 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 700,000 | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 594,900 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | - | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 150,000 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 150,000 | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 183,000 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 339,818 | |
| 6 | 5 | 1 | 3 | තැන්පතු ගෙවීම් | - | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 606,993 | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 209,500 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 415,667 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 50,000 | |
| | | | | එකතුව | | 282,149,401 |
| | | | | දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය | - | 67,307,526 |

.............................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 2023/02/24

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

ඇමුණුම - 03

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | ආදායම් 2022 | ආදායම් 2022 |
|---|---|---|---|---|---|---|
| | | | | | රු | රු |
| | | | | | | |
| 1 | 1 | | | ප්‍රදාන | 29,050,967 | |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 90,012,050 | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | 1,291,057 | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 279,561,638 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 56,452 | |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | 330,000 | |
| 4 | 2 | | | වෙනත් | | |
| | | | | | | |
| | | | | ආදායම් එකතුව | | 400,302,163 |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | 2022 වියදම් | 2022 වියදම් |
|---|---|---|---|---|---|---|
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | | |
| 6 | 1 | 1 | | දේශීය තරඟාවලි | 38,943,300 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 79,053,719 | |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 83,151,500 | |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 2,601,004 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම | 700,000 | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 594,900 | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | - | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | - | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 150,000 | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 150,000 | |
| 6 | 4 | 3 | | නිලධාරීන්ගේ හැකියා වර්ධනය | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරීන් සඳහා පරිපාලන දීමනා | 183,000 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 361,818 | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 547,490 | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශණ කමිටුව | 209,500 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 415,667 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 50,000 | |
| | | | | | | |
| | | | | එකතුව | | 207,111,898 |
| | | | | අතිරික්තය | - | 193,190,265 |

..........................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 2023/02/24

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

ජාතික ක්‍රීඩා අරමුදල

**2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැය හා සත්‍ය වියදම් සැසඳීම**

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය | වෙනස | වෙනස මුලික වියදම් ඇස්තමේන්තු වේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. | රු. | | |
| | | | | ලැබීම් | | | | | |
| 1 | 1 | | | ප්‍රදාන | 18,000,000 | 29,050,967 | 11,050,967 | 61 | පරිපූරක ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලැබීම |
| 1 | 2 | | | ආදායම් - ජාතික ලොතැරැයි මණ්ඩලය | 25,000,000 | 25,000,000 | - | - | |
| 1 | 3 | | | වෙනත් | - | | - | | |
| 2 | 1 | | | ස්ථාවර තැන්පතු ආපසු ගැනීම | - | - | - | | |
| 2 | 2 | | | ස්ථාවර තැන්පතු පොළී | - | - | - | | |
| 3 | 1 | | | දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය | - | - | - | | |
| 3 | 2 | | | අනුග්‍රාහක ලැබීම් | 279,504,788 | 279,561,638 | 56,850 | 0 | |
| 3 | 3 | | | වෙනත් ආදායම් හා ගැලපීම් | 390,000 | 56,452 | (333,548) | (86) | අවශ්‍යතා ඇති නොවීම |
| 4 | 1 | | | තැන්පතු ලැබීම් | | | - | | |
| 4 | 2 | | | වෙනත් | | | - | | |

| වැය විෂය | | | | ගිණුමේ නම සහ විස්තරය | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය | වෙනස | වෙනස මූලික වියදම් ඇස්තමේන්තු වේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | රු. | රු. | රු. | | |
| | | | | ගෙවීම් | | | | | |
| 5 | 1 | | | ආයෝජන සැලසුම් | 75,000,000 | 75,000,000 | - | - | |
| 5 | 2 | | | වෙනත් ආයෝජන | | | - | | |
| 6 | 1 | 1 | | දේශීය තරගාවලි | 39,000,000 | 38,943,300 | 56,700 | 0 | |
| 6 | 1 | 2 | | ජාත්‍යන්තර තරඟ | 87,500,000 | 79,053,719 | 8,446,281 | 10 | අවශ්‍යතා සීමා වීම |
| 6 | 1 | 3 | | පදක්කම්ලාභීන්ට හා පුහුණුකරුවන්ට ගෙවීම් | 75,200,000 | 83,151,500 | (7,951,500) | (11) | ජයග්‍රහණ වැඩිවීම නිසා |
| 6 | 2 | 1 | 1 | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා | 2,650,000 | 2,601,004 | 48,996 | 2 | |
| 6 | 2 | 1 | 2 | හිටපු ක්‍රීඩක. ක්‍රීඩිකාවන් සඳහා ගෙවීම් | 700,000 | 700,000 | - | - | |
| 6 | 2 | 1 | 3 | වෙනත් | 500,000 | 594,900 | (94,900) | (19) | |
| 6 | 2 | 2 | 1 | පුහුණුකරුවන් සඳහා දීමනා | - | - | - | | |
| 6 | 2 | 2 | 2 | පුහුණුකරුවන් සඳහා වෙනත් වියදම් | - | - | - | | |
| 6 | 2 | 2 | 3 | වෙනත් | - | - | - | | |
| 6 | 3 | 1 | | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | - | - | - | | |
| 6 | 4 | 1 | | ක්‍රීඩකයින්ගේ හැකියා වර්ධනය | 150,000 | 150,000 | - | - | |
| 6 | 4 | 2 | | පුහුණුකරුවන්ගේ හැකියා වර්ධනය | 150,000 | 150,000 | - | - | |
| 6 | 4 | 3 | | නිලධාරින්ගේ හැකියා වර්ධනය | - | - | - | | |
| 6 | 5 | 1 | 1 | නිලධාරින් සඳහා පරිපාලන දීමනා | 184,000 | 183,000 | 1,000 | 1 | |
| 6 | 5 | 1 | 2 | විගණන ගාස්තු | 340,000 | 339,818 | 182 | 0 | |
| 6 | 5 | 1 | 3 | තැපැල් ගෙවීම් | - | - | - | | |
| 6 | 5 | 1 | 4 | වෙනත් | 610,000 | 606,993 | 3,007 | 0 | |
| 6 | 5 | 2 | 1 | අභියාචනා උපදේශක කමිටුව | 210,000 | 209,500 | 500 | 0 | |
| 6 | 5 | 2 | 2 | ජාතික ක්‍රීඩා සභාව | 420,000 | 415,667 | 4,333 | 1 | |
| 6 | 5 | 2 | 4 | පුහුණුලාභීන් සඳහා ගෙවීම් | 50,000 | 50,000 | - | - | |

ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2023/02/24

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

සටහන් - 11

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2022.12.31 ස්ථාවර තැන්පත් සහ ස්ථාවර තැන්පත් ආයෝජන පොලී

| ගිණුම් අංකය | මුදල | ආරම්භක දිනය | මුදල් වර්ෂය | දින ගණන | මුදල | පොලී අනුපාතය | පොලිය | රඳවා තබා ගැනීමේ බද්ද 5% | ශුද්ධ පොලී මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|
| 78404430 | 8,469,181 | 2022/01/01 | 2022/12/31 | 365 | 8,469,181 | 5.50% | 465,805 | 23,290 | 442,515 |
| 78404516 | 8,469,181 | 2022/01/01 | 2022/12/31 | 365 | 8,469,181 | 5.50% | 465,805 | 23,290 | 442,515 |
| 90054788 | 25,000,000 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,466 | 7,123 | 135,342 |
| 90054780 | 25,000,000 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,466 | 7,123 | 135,342 |
| 90054792 | 25,000,000 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,466 | 7,123 | 135,342 |
| | 91,938,363 | | | | | | 1,359,007 | 67,950 | 1,291,057 |

...........................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 2023/02/24

සටහන් - 12

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2022.12.31 දිනට විවිධ ණය ගැතියෝ

| 2021 රු. ශත | වැය විෂය | | | ගිණුම් සටහන් සහ විස්තර | ගිණුම් සටහන් | 2022 රු. ශත |
|---|---|---|---|---|---|---|
| 849,304 | 2 | 2 | | ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොළී | 16 | 1,291,057 |
| | | | | | | - |
| 29,421,593 | 1 | 2 | | ලැබිය යුතු ජාතික ලොතැරැයි මණ්ඩල ආදායම් | 14 | 94,433,643 |
| | | | | | | - |
| 30,270,897 | | | | එකතුව | | 95,724,700 |

............................
ප්‍රධාන ගණකාධිකාරි
නම :
දිනය : 2023/02/28

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
[illegible] මාවත.

16

සටහන් - 13

ජාතික ක්‍රීඩා අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

| 2021 නැවත ප්‍රකාශිත රු. ශත | ගිණුමේ නම සහ විස්තරය | 2022 රු. ශත |
|---|---|---|
| | | |
| 49,141,721 | 2022.01.01 දිනට සමුච්චිත අරමුදල | 61,608,323 |
| | | |
| | | |
| 12,466,602 | 2022 වර්ෂයේ ඌණතාවය/අතිරික්තය | 193,190,265 |
| | | |
| | | |
| 61,608,323 | 2022.12.31 දිනට සමුච්චිත අරමුදල | 254,798,589 |

............................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2023/02/24

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

සටහන් - 14

ජාතික ක්‍රීඩා අරමුදල

2022.12.31 දිනට අවසාන ගිණුම් සඳහා සටහන්

ලොතැරැයි ආදායම - ගි.අංක 041 සහ ලැබිය යුතුලොතැරැයි ආදායම - ගි අංක. 017

| | | රු. |
|---|---|---|
| * | 2022 වර්ෂයේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මහාභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති ලොතැරැයි ආදායම ලෙස ගිණුම්ගත කල මුදල | 90,012,050 |
| * | 2022 වර්ෂය තුල මහා භාණ්ඩාගාරයෙන් ලද මුදල | 25,000,000 |
| * | 2022.12.31 දිනට තවදුරටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල | 94,433,643 |

2022 වර්ෂයේ ලොතැරැයි ආදායම

| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | | 29,421,593 |
|---|---|---|
| මාසය | මාසයට අදාල මුදල රු. ශත | |
| ජනවාරි | 6,650,264 | |
| පෙබරවාරි | 6,187,436 | |
| මාර්තු | 472,428 | |
| අප්‍රේල් | 4,012,200 | |
| මැයි | 5,111,270 | |
| ජුනි | 6,348,540 | |
| ජූලි | 6,165,240 | |
| අගෝස්තු | 7,227,490 | |
| සැප්තැම්බර් | 9,676,740 | |
| ඔක්තෝබර් | 12,662,690 | |
| නොවැම්බර් | 10,401,590 | |
| දෙසැම්බර් | 15,096,162 | |
| 2022 වර්ෂය සඳහා අයවිය යුතු මුදල | | 90,012,050 |
| මුළු අයවිය යුතු මුදල | | 119,433,643 |
| අඩු කළා- භාණ්ඩාගාරයෙන් ලැබීම් | | 25,000,000 |
| 2022.12.31 දිනට අවසන් ශේෂය | | 94,433,643 |

.........................................

ප්‍රධාන ගණකාධිකාරී

නම :

දිනය : 2023/03/29

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

සටහන් - 15

## ජාතික ක්‍රීඩා අරමුදල

## 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගෙවිය යුතු වියදම්

| අනු අංකය | ගෙවිය යුතු අයගේ නම | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | විගණකාධිපති | 2022 වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන්කිරීම | 172,000.00 |
| | එකතුව | | 172,000.00 |

..................................

ප්‍රධාන ගණකාධිකාරි

නම :

දිනය : 2023/02/24

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07

සටහන් - 16

# ජාතික ක්‍රීඩා අරමුදල

## 2022.12.31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි

| ලැබිය යුතු ස්ථාවර තැන්පත් ආයෝජන පොලි - | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පොළිය ගණනය කළ ආකාරය | | | | |
| ගිණුම් අංකය | සිට | දක්වා | දින ගණන | ආයෝජන මුදල | පොළි අනුපාතය | පොළිය | රඳවා තබා ගැනීමේ බද්ද 5% | ශුද්ධ පොළි මුදල |
| 78404430 | 2022/01/01 | 2022/12/31 | 365 | 8,469,181 | 5.50% | 465,804.98 | 23,290.25 | 442,515 |
| 78404516 | 2022/01/01 | 2022/12/31 | 365 | 8,469,181 | 5.50% | 465,804.98 | 23,290.25 | 442,515 |
| 90054788 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,465.75 | 7,123.29 | 135,342 |
| 90054780 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,465.75 | 7,123.29 | 135,342 |
| 90054792 | 2022/12/23 | 2022/12/31 | 8 | 25,000,000 | 26.00% | 142,465.75 | 7,123.29 | 135,342 |
| එකතුව | | | | | | 1,359,007.22 | 67,950.36 | 1,291,057 |

.........................................
ප්‍රධාන ගණකාධිකාරී
නම :
දිනය :

එස්.එන්. හපුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරී
තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
අංක 09, පිලිප් ගුණවර්ධන මාවත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. SYA/A/NSF/6/22/11
ඔබේ අංකය / உமது இல. / Your No. CFO
දිනය / திகதி / Date 2023 අගෝස්තු දින

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

විගණකාධිපති විසින් අත්සන් කරන ලද යථෝක්ත වාර්තාව සහ සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශනවල පිටපතක් මේ සමඟ එවා ඇත.

එස්.එම්.එන්.තිලකරත්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්:
1. ලේකම් - ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

CA.
F.N.A
9/5

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. : SYA/A/NSF/6/22/11

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2023 අගෝස්තු [illegible] දින

ලේකම්

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

**ජාතික ක්‍රීඩා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරිමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදල සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති රෙගුලාසි යොමුව | | විස්තරය |
| --- | --- | --- |
| (අ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය | 2022 වර්ෂය සඳහා අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) | මුදල් රෙගුලාසි 877 (1) (ඇ) සහ (ඈ) | 2022 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.2.4** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදන කර භාවිතා කර නොමැති බව.

**3.** වෙනත් කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා සඳහා 2022 වර්ෂයේ අයවැය මගින් රු.10,000,000 ක වෙන්කර සංශෝධිත අයවැය මඟින් එය රු.2,650,000 දක්වා අඩුකර තිබුණි. 2022 වර්ෂයේ මේ සඳහා වැය කල සත්‍ය වියදම රු. 2,601,004 ක් වූ අතර එයින් රු.1,191,004 ක් විදේශීය පුහුණුව ලබන

ක්‍රීඩකයින් දෙදෙනෙකු සඳහා මාසිකව ගෙවනු ලැබූ දීමනා සහ රු.1,410,000 ක් උසස් කාර්යසාධන වැඩසටහන යටතේ අනුග්‍රහය දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා දෙනු ලබන පෝෂණ දීමනා විය. 2021 වර්ෂයේ වැය කල රු.8,215,107 ක වියදමට සාපේක්ෂව 2022 වර්ෂයේ වියදම සියයට 68 න් අඩු වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වර්ධනය වුවද ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයේ මුල් අයවැය අනුව රු.4,600,000 ක් වූ පුහුණුකරුවන් සඳහා සුභසාධන දීමනා සංශෝධිත අයවැය මගින් කපාහැර තිබුණු අතර මේ අනුව ක්‍රීඩකයින්ගේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන පුහුණුකරුවන්ගේ අභිප්‍රේරණය නැංවීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කරගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යා යුතුව තිබුණද තිබුණ ද, 2022 වර්ෂයේ අයවැය මගින් ක්‍රීඩකයින්, පුහුණුකරුවන් හා නිළධාරින්ගේ හැකියා වර්ධනය සඳහා වෙන්කර තිබුණු රු.21,500,000 ක ප්‍රතිපාදනයන් සංශෝධිත අයවැය මගින් රු.300,000 ක් දක්වා සියයට 98.6 කින් අඩුකර තිබුණි.

(ඈ) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වූ ජාතික ක්‍රීඩාවන් 66 ක් පැවතිය ද 2022 වර්ෂයේදි ජාතික ක්‍රීඩා අරමුදල විසින් ජාතික ක්‍රීඩා 21 ක් සඳහා පමණක් රු. 167,437,307 ක් වූ මූල්‍ය අනුග්‍රහකත්වයක් ලබා දී තිබුණි. එම අගයෙන් රු. 38,388,967 ක් එනම් සියයට 23 ක් මලල ක්‍රීඩාව සඳහා ද , රු. 32,918,499 ක් එනම් සියයට 19.6 ක් නෙට්බෝල් ක්‍රීඩාව සඳහා ද , රු. 15,000,000 ක් එනම් සියයට 8.9 ක් රග්බි ක්‍රීඩාව සඳහා ද වැය කර තිබුණි. මේ අනුව වැය කල අගයෙන් සියයට 51.5 ක් ජාතික ක්‍රීඩා 03 ක් වෙනුවෙන් පමණක් වැය කර තිබුණි. ජාතික ක්‍රීඩා 66 ක් පැවතිය ද ජාතික ක්‍රීඩා 21 ක් සඳහා පමණක් අරමුදලේ මූල්‍යාදායකත්වය ක් ලබාදීම හේතුවෙන් ජාතික ක්‍රීඩා සඳහා ධෛර්යදීම, සහ සංවර්ධනය කිරිම කෙරෙහි ජාතික ක්‍රීඩා අරමුදල විසින් ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි.

(ඉ) අන්තර් පාසල් ක්‍රීඩා කටයුතු නගාසිටුවීම වෙනුවෙන් විශේෂ අවධානයක් යොමුකර නොතිබුණ අතර ක්‍රීඩා තරඟ වලට සහභාගී වීම සඳහා එක් දිස්ත්‍රික්කයක පාසල් 3ක් සඳහා පමණක් සඳහා රු. 300,000 ක් වැය කර තිබුණි.

(උ) පොදු රාජ්‍ය මණ්ඩලීය හා ආසියානු ක්‍රීඩා උළෙල ඉලක්ක කරමින් උසස් කාර්යසාධන වැඩසටහන යටතේ ක්‍රීඩකයින්ගේ හැකියාවන් වර්ධනය කර අදාළ තරඟ ජයග්‍රහණය කිරීම අපේක්ෂාවෙන් මලල ක්‍රීඩා, පැරා ක්‍රීඩා, ජූඩෝ, බැඩ්මින්ටන්, බර ඉසිලීම සහ බොක්ෂිං යන ක්‍රීඩාවන් 06 ක තෝරාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 58 ක් හා පුහුණුකරුවන් 32 ක් සඳහා ජාතික ක්‍රීඩා අරමුදල විසින් මාසයකට ක්‍රීඩකයෙක් සඳහා රු. 100,000 බැගින් සහ පුහුණුකරුවෙකු සඳහා රු. 50,000 බැගින් දීමනාවක් ගෙවීමට 2021 වර්ෂය තුළ දී කටයුතු කර තිබුණි.ඒ අනුව, 2022 ජුලි සිට අගෝස්තු දක්වා පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කළ, පිහිනීම, ජිම්නාස්ටික්, ස්කොෂ්, මේස පන්දු, බාස්කට්බෝල්, බීච් වොලිබෝල්, ක්‍රිකට් (කාන්තා),රග්බි සහ මල්ලව පොර යන ක්‍රීඩාවන් 9 ක් සඳහා මෙම වැඩසටහන යටතේ අනුග්‍රාහකත්වය ලැබී නොතිබුණි. ඒ අනුව, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කල 116 ක් වූ සමස්ථ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරින් 78 දෙනෙකු එනම් සියයට 67 ක් සඳහා මෙම වැඩසටහන යටතේ අනුග්‍රහය ලබාදී නොතිබුණි.

(ඌ) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ කාන්තා නිදහස් ආර කිලෝග්‍රෑම් 57 බර පංතියේ මල්ලව පොර තරඟයෙන් ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් හිමි කර දුන් මල්ලව පොර ක්‍රීඩාව උසස් කාර්යසාධන වැඩසටහන යටතේ දීමනා ලැබීමට තෝරාගත් ක්‍රීඩා ඉසව්වක් නොවීම තුළින් ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් හිමිකර දීමට සමත් වූ ක්‍රීඩිකාවට උක්ත වැඩසටහන යටතේ ලැබිය යුතු දීමනාව සහ මාසික පෝෂණ දීමනාව අහිමිව තිබුණි. මෙම වැඩසටහන යටතේ අනුග්‍රාකත්වය ලබාගෙන තිබූ සමස්ථ ක්‍රීඩක සංඛ්‍යාවෙන් සියයට 55 ක් වූ ක්‍රීඩකයින් 32 ක් සහ පුහුණුකරුවන් 32 දෙනෙකු අතරින් 27 දෙනෙකු පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කර නොතිබුණි.

මෙම වැඩසටහන සඳහා අනුග්‍රහය ලබා දීමට නිර්නායකයන් ඇතුලත් ක්‍රමවේදයක් අනුව ක්‍රීඩාවන් තෝරා ගැනීමට කටයුතු කර ඇතත් එම ක්‍රමවේදය අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ කඹුරුපිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදල විසින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.9,157,992 ක මුදලක් ලබාදී තිබූ අතර මුළු කොන්ත්‍රාත් වියදම රු.7,265,483 ක් විය. ඉතිරි මුදල වන රු.1,892,509 ක් 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා වසරකුත් මාස හයක කාලයක් තුළ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර ඇතත් එම මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත ආපසු ලබාගැනීමට හෝ වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති